දිවි තොර කරගැනීම් යනු මහජන සෞඛ්‍ය ගැටළුවක් වන බැවින් ඒ පිළිබඳව සමාජයට දැනුවත් භාවයක් ලබාදීමත්, එවැනි සිදුවීම් වාර්තා කිරීමත් අවශ්‍ය වේ. කෙසේ නමුත්, එම දිවි තොර කරගැනීම් වාර්තා කරනා ආකාරය පිළිබඳව මාධ්‍ය දැඩි ප්‍රවේසමක් හා ආචාර ධාර්මික ප්‍රවේශයක් ගැනීම අවශ්‍ය වන්නේ, වගකීම් රහිත ලෙසින් දිවි තොර කරගැනීම් වාර්තාකරණය ඔස්සේ, අනුකාරක සිදුවීම් වලට පහසුවෙන් මඟ පෑදිය හැකි බැවිනි.

ගම්පොළ කහටපිටියේදී කාන්තාවක් දිවි තොර කරගැනීමට තැත්කිරීමේ සිදුවීමක්, ස්වර්ණවාහිනී සහ ස්වාධීන රූපවාහිනී රාත්‍රී ප්‍රධාන පුවත් ඔස්සේ (ජුනි 26, 2022) වාර්තා වී තිබිණි. එම පුවත් වාර්තාවන්හි දැකිය හැකි මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල නොවූ තැන් මෙසේ පෙන්වා දිය හැක.

1) දිවි තොර කරගැනීමේ ප්‍රයත්නය CCTV දර්ශන ඔස්සේ පෙන්වයි.

2) ප්‍රේක්ෂකයින්ට නැරඹීමට අපහසු විය හැකි සංවේදී දසුන් පෙන්වයි. (ස්වර්ණවාහිනී පුවත් තුළ එම දර්ශනයන්හි කුඩා කොටසක් පමණක් බොඳ කර ඇත.)

3) උපකාරක අංක සඳහන් නොකරයි.

එසේ නම්, ස්වර්ණවාහිනී හා ස්වාධීන රූපවාහිනී නාලිකා, මෙම සිදුවීම වගකීම් සහගතව වාර්තා කර ඇතැයි ඔබ සිතන්නේ ද?

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පවත්නා තත්වයද සැලකිල්ලට ගත් විට, දිවි තොර කරගැනීමක් හෝ ඊට තැත් කිරීමක් වාර්තා කිරීමේදී මාධ්‍ය නිසි මාර්ගෝපදේශ පිළිපැදීමක්, ආචාර ධාර්මිකත්වයක් සහ වගකීම් සහගත බවක් පෙන්වීම අත්‍යවශ්‍ය වේ. මාධ්‍ය වගකීම වන්නේ දිවි තොර කරගැනීම් මහජන සෞඛ්‍ය ගැටළුවක් ලෙසින් දක්වා, සමාජය දැනුවත් කොට ජීවිත සුරැකීමට දායක වීම විනා, අනුකාරක සිදුවීම් සඳහා හේතුවක් බවට පත් නොවීම බව අපි මෙසේම පවසමු.

උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැකගනිමු!

හදිසි උපකාරක අංක:

*CCCline - 1333

* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860

*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:

https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf

https://media.samaritans.org/.../Media_Guidelines_FINAL